ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ විශිෂ්ටයන් උදෙසා සම්මාන පිරිනැමේ

ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ විශිෂ්ටයන් උදෙසා සම්මාන පිරිනැමීමේ උළෙලේ 19වැනි සහ 20වැනි පියවර මාර්තු 22වැනිදා (හෙට) කොළඹ හිල්ටන් හෝටලයේ 'බිලූ' ශාලාවේදී උත්කර්ෂවත් අයුරින් පැවැත්වෙයි.

කෝවිඩ්-19 ගෝලීය වසංගතය හේතුවෙන් 2020 හා 2021 දෙවසර පුරාවත් කර්මාන්තයට හා ජනමාධ්‍යවේදීන්ට බොහෝ ඉතා අසහජත් දෑ අපුරුද්දක් සෙස හැඳින්විය හැකිය.

එසේ වුවද සොබා හා සංවරණ සීමා හේතු කර ගෙන තමන්ගේ කාර්යාල අංශ වසා දැමා තිබියදී තම කාර්යයන් නිමවෙයි සිට සිදුකල ජනමාධ්‍යවේදීන් දිරිමත් කිරීම සඳහා ජනමාධ්‍ය විශිෂ්ටයන් වෙත එම දෙවසර සඳහා සම්මාන පිරිනැමීමේ උළෙල මෙවර මාර්තු 22වැනිදා පස්වරට 4.00ට අරඹමි.

සියලු, දේශීය හා ඉංග්‍රීසි යන භාෂාවන්ට අයත් දිනපතා පුවත්පත් 18ක් සහ සතිපතා පුවත්පත් 18ක් සම්මාන උළෙලට ඇතුළත් වව 2019 හා 2020 විශිෂ්ටයන් උදෙසා ජනමාධ්‍ය සම්මාන වඩාසටහනේ කැඳවුම්කරු සුගතපාල රොස්සුවිදු සඳහන් කරයි.

1998දී ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් ආරම්භ කරන ලැබූ මෙම උත්සවය මේ වනවිට ශ්‍රී ලංකා කර්තෘ සංසදය සංවිධානය කරනු ලබන්නේ, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ සහයෝගයද ඇතිවය. මෙය මෙරටට පවතින විශාලතම මාධ්‍ය සම්මාන පූජාගාන්සියයි.

මෙම සම්මාන උළෙලේ අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍යයන්හි විශිෂ්ටයන් හඳුනාගැනීමේන් එම විශිෂ්ටයන්ට සම්මාන පිරිනැමීමත්‍ය. එසේම දීර්ඝ කාලයක් පත්කාලය ක්ෂේත්‍රයේ සේවය කරමින් වෘත්තීය ජීවිතයේ විශේෂ මෙහෙවරක් ඉටුකළ අය සඳහා ජීවිත කාලයේ එක්වරක් පමණක් පිළෙන ස්වර්ණ මුද්‍රිත විශේෂ සම්මාන පිරිනැමීමද සිදුවෙයි.

වෘත්තීය ජීවිතයේ ඉටුකළ යුග මෙහෙවර උදෙසා, 2020 වසර වෙනුවෙන් විශේෂ සම්මානයට පාත්‍ර වන සම්මානලාභීන්නු මෙසේ වෙති.

- උපාලි ෆොන්සේකා
- ඩී.පී. විතුමසිංහ
- පුෂ්පා රොවෙල් මහත්මිය
- සමන් චන්ද්‍රනාත් වීරසිංහ

මෙම උත්සවයේදී කර්තෘ සංසදය විසින් නම් කරනු ලැබූ දෙදෙනකු උදෙසා විශේෂ සම්මාන දෙකක්ද පිරිනැමේ. ඒ අනුව සතෘදායන්ගේ හා පොදු මහජනතාවගේ අනෙකුත් පාත්‍ර වූ මාධ්‍යවේදියා සඳහා ඩී.ආර්. පිපියරිවර්ධන සම්මානයත්, ශ්‍රී ලංකාවේ පුවත්පත් නිදහස ආරක්ෂා කිරීම සඳහා සැපයිකිරීම වෙනුවෙන් සේවාය ගුණයේන සම්මානයත් මෙතිදී පිරිනැමේ.

එසේම ජීවිත කාලයේදී එක්වරක් පමණක් පිළෙන රන් සම්මාන පිරිනැමෙන සම්මානලාභීන්ගේ කෙටි වෘත්තීය ජීවිතයේ සටහනක් මෙසේය.

උපාලි ගොන්සේකා :-

උපාලි ෆොන්සේකා මහතා ජාතාරසය ශිල්පියෙකු ලෙස ලංකාවේ සිමා සහිත එක්සත් පුවත්පති පත්‍ර (ලේක්හවුස්) සමාගමේ අවුරුදු 37ක අඛණ්ඩ සේවාවක නිරත වී ඇත. 1973දී ලේක්හවුස් ආයතනයෙන් තම වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඔහු මධ්‍යම පුවත්පති කාර්යාංශයේ ගිලගස් ජායාරූප ශිල්පියෙකු ලෙස කටයුතු කළේය. 1977දී හෙතෙම සේවාවේ සේවා කරමු ලැබූ පසු 'තරුණ' පුවත්පතේ කටයුතු කර ඉන් අනතුරුව 'සරසවිය' පුවත්පතේ සේවය කළේය.

1995දී ලේක්හවුස් ආයතනයේ ජායාරූප ඇංශයේ නියෝජ්‍ය ජායාරූප තතුවර ධුරයට උසස්වීමක් ලැබූ ඔහු 2000 වසරේදී ජායාරූප සහකාර කර්තෘ ධුරයට පත් වූයේය. ඔහු සිය සේවක්ත විෂය ඩිප්ලෝමාවක්ද ලබා ගන්නේය. දීර්ඝ වෘත්තීය ජීවිතයකින් පසුව 2009දී ඔහු විශ්‍රාම ගත්තද 2010 වනතුරු තවත් වසරක් සේවය කරන ලෙස ඔහුගෙන් ඉල්ලා තිබේ. ඔහු කොටහේනේ සාන්ත ලුසියා විද්‍යාලයේ ආදි සිසුවෙකි.

ඩී.පී. විතුමසිංහ :-

ඩී.පී. විතුමසිංහ මහතා සිමා සහිත එක්සත් පුවත්පති පත්‍ර සමාගමේ (ලේක්හවුස්) වසර 35ක් සේවය කර ඇත. මීතුරන් විසින් 'ඩීපී' යනුවෙන් හඳුන්වනු ඔහු 'දවස' සඳුනයට පරිවර්තනකයෙක ලෙස බැඳී ඉන්පසු 1960 ගණන් අගදී 'සන්' පුවත්පතේ සේවය කළේය. අනතුරුව එ.ජා.ප. පුවරක ඒකකයට බැඳුණු ඔහුට එස්මන්ඩ් විතුසෙවිංහ මහතා සමග සමීපව කටයුතු කරන්නට ලැබිණි. විතුසෙවිංහ මහතා වෙනුවෙන් පරිවර්තන කටයුතු කළ ඔහු 1977 අගෝස්තුවේ මහ මැතිවරණයෙන් පසුව 'ලිඩිලි හිවිස්' පුවත්පතට පරිවර්තකයෙකු ලෙස බඳුනණිය. ධර්මපාල වෙත්තසිංහ කර්තෘවරයාගේ පටන්ගෙන කතුවරුන් 14දෙනෙකු යටතේ ඔහු සේවය කළේය. 2000දී සයකාර පුවත්පති කර්තෘ ධුරයට උසස් කරනු ලැබූ ඔහු ඉන් අනතුරුව ගිගොජ්ජ ප්‍රාදේශීය පුවත්පති කර්තෘ බවට පත් වී 2007 විශ්‍රාම ගන්නතුරු එම ධුරයේ කටයුතු කළේය. ගාල්දේ වේමන්ඩ් විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ ඔහු, බාහිර ඕෂයෙකු ලෙස වික්ටෝරියාලය ඇසඳුත් වී පුදුසුකම් ලැබුවේය. ඔහුගේ ලියාපත විෂය දේශපාලන විද්‍යාව වුවද ඔහුට හඳාරන්නට සිදුවූයේ මාණික්වේදී උපාධියයි.

පුෂ්පා රොවෙල් මහත්මිය :-

පුෂ්පා රොවෙල් මහත්මිය සිමා සහිත එක්සත් පුවත්පති පත්‍ර සමාගමේ (ලේක්හවුස්) වසර 42ක් සේවය කර තිබේ. අදය තම ජනමාධ්‍යවේදී වෘත්තීය ජීවිතය 1977දී ආරම්භ කළේ. මධ්‍යම පුවත්පති කාර්යාංශයට සම්බන්ධ වෙමිනි. 1979 උපකතුවරියක ලෙස අදය 'දිනමිණ' පුවත්පතට සම්බන්ධ වූවාය. නියෝජ්‍ය ප්‍රධාන උපකර්තෘ, නියෝජ්‍ය උපකර්තෘ සහ සහකාර කර්තෘ ධුරයට උසස්වීම් ලැබූ අදය 2015දී 'දිනමිණ' පුවත්පතේ කර්තෘ ධුරයට පත් කරනු ලැබ 2019 දෙසැම්බර් 31වැනිදා විශ්‍රාම ලැබුවාය. කොළඹ-10 ප්‍රෙස්බිටීරියන් බාලිකා විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ අදය, කොළඹ-7 ස්ටැන්ලි කාන්තා විද්‍යාලයේදී මූලික අධ්‍යාපනය සම්පූර්ණ කර, 1972දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී (බී.ඒ.) උපාධිය ලබාගන්නාය. 2017 මාර්තු වාර්තාසාක සම්මානය දිනූ 50දෙනා අතරින් අදය එක් අයෙක් වූවාය. 2018දී කතෘදික්ක වරක සංගමය විසින් අදට විශිෂ්ට කාලය පුරා කළ මෙහෙවර වෙනුවෙන් සම්මානයක් පුදැනු ලැබුවාය.

අභාවප්‍රාප්ත සමන් චන්ද්‍රනාත් වීරසිංහ :-

සමන් චන්ද්‍රනාත් වීරසිංහ මහතා ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නොමසෙකන සටහනක් තබා ගොසබ්ලා මෙලොව හෑර ගිය පුවීණ ජනමාධ්‍යවේදියෙකි. ගරු බුහුමනට පාත්‍ර වූ ජනමාධ්‍යවේදියෙකු වූ ඔහුගේ හැකියාව කර්තෘත්වයෙන් ප්‍රවෘත්ති, විශේෂාංග රචනයේ සිට ඔහු විශේෂ දක්ෂතා පළ කළ ගීත පදමාලා රචනා කිරීමේ කලාව දක්වා විහිදී ගියේය.

වීවීධ විෂයන් පිළිබඳ පාලුල පුහුණුක් ගිම්කර ගෙන තිබූ ඔහු අතිශය දක්ෂ පුවීණ ජනමාධ්‍යවේදියෙක් විය. ගීත රචනයෙකු ලෙස ඔහු ගීත 1,500කට වඩා රචනා කර තිබේ. ඔහු සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේ, 'ලංකාදීප' පුවත්පතෙනි. ඉන් අනතුරුව ඔහු 'දිනමිණ' පුවත්පතේ තතතුරු කිහිපයක්ම හෙබ විය. විශ්‍රාම ගන්නාවිට ඔහු 'දිනමිණ' පුවත්පතේ උපදේශක කතුවරයෙකු ලෙස කටයුතු කළේය. ඊරසිංහ මහතා 'ලංකාදීප' පුවත්පතේ ඕපධ කර්තෘ විදාගත විමල් වීරසිංහගේ පුත්‍රයාය.

හිල්ටන් හෝටලය හා Press Club අතර ගිවිසුම දීර්ඝ වෙයි

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය මගින් ක්‍රියාත්මක වන මාධ්‍ය සමාජයේ (Press Club) සත්කාරක හෝටලය ලෙස කොළඹ හිල්ටන් හෝටලය සමග අත්සන් කර ඇති ගිවිසුම තවදුරටත් දීර්ඝ කිරීමට එම ආයතනය පසුගිය සතියේ කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ වීවීධ මහජන වැඩසටහන් සඳහා සත්කාරක කටයුතු කිරීමේ අරමුණින් මාධ්‍ය සමාජය (Press Club) පසුගිය වසරේ ස්ථාපිත කෙරුණු නමුත්, එවක පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් එම කටයුතු බොහෝදුරට සිමා කිරීමට සිදුවිය.

'තොරතුරු දැනගැනීමේ අයිතිය' විෂය යටතේ එක්සත් රාජ්‍යාණ්ඩයේ ගෙස්ටපි සාමිවරයා විසින් සිදුකරන ප්‍රසිද්ධ දේශනයක් එළඹෙන සතියේ පැවැත්වෙමින අතර, එයට සත්කාරය දැක්වීමටද මාධ්‍ය සමාජය කටයුතු කර ඇත.

රුසියාවේ යුක්රේන අර්බුදය ඇරඹී දින 25ක් සම්පූර්ණ වෙයි

යුක්රේනයේ හඳුනාගත් ස්ථාන වෙත රුසියාවෙන් හයිපර්සොනික් මිසයිල ප්‍රහාර

"රුසියාව සමග තේරුමක් ඇති සාකච්ඡාවක් සිදු කිරීමට සූදානම්" - යුක්රේන ජනාධිපති පවසයි

රුසියානු හමුදාවන් යුක්රේනය ආක්‍රමණය කිරීමේ මෙහෙයුම් අරඹා දින්ය දිනය වනවිට දින 25ක කාලයක් ගත වී තිබේ. පෙබරවාරි 24වැනිදා යුක්රේනයේ ඩොන්බාස් ප්‍රදාන සහ රුසියානු අතර දේශසීමාවේ සිටි රුසියානු සෙබළුන් සහ ගුවනින් යුක්රේනයේ ස්ථාන වෙත ඉල්ලා වූ මිසයිල ප්‍රහාර සමග මෙම ආක්‍රමණය ආරම්භ විය.

මේ අතර යුක්රේන - රුසියානු ගැටුම තවදුරටත් දරුණු කරමින් රුසියාව පසුගියදා යුක්රේනය වෙත සිය දිග දුර හයිපර්සොනික් මාදිලියේ ශබ්දයටත් වඩා වේගයෙන් යැවිය හැකි මිසයිල සහ කෘස් මිසයිල ප්‍රහාර එළඹ සළ බව විදෙස් මාධ්‍ය පවසයි. ඒ අනුව රුසියාවේ මෙම පියවර පසුගිය සතිඅන්තය වන විට බොහෝදුරාගේ අවධානයට මෙන්ම විවේචනයටත් පත්ව තිබුණි.

මේ අතර රුසියානු ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රකාශකවරයා වන මේජර් ජනරාල් ඉගොර් කොනාෂෙන්කොව් තමන් යුක්රේනයට එරෙහිව හයිපර්සොනික් මිසයිල භාවිත කළ බව පැයේ (24ලා) දිනයේදී පිළිගන්නේය. එහිදී Kinzhal හයිපර්සොනික් මිසයිල මේ සඳහා යොදා ගෙන තිබේ. කළු මුහුදේ පිහිටි යුක්රේන වරායක් වන ඔඩේසාලයිට් ආයුධයේ පිහිටි යුක්රේන ඉන්ධන බබඩාවක් ඉලක්කය වී ඇත.

මෙම මිසයිලයකට කිලෝමීටර් 1,200ක් දුරින් පිහිටි ඉලක්කයකට වුවද සාර්ථකය පහරදීමේ හැකියාවක් පවතින බව ඔහු සඳහන් කරයි. එසේම මෙම මිසයිලයක් ශබ්දයේ වේගය මෙන් 10 ගුණයක වේගයෙන් ඉලක්කය සොයා ගමන් කරන බවත් පැවසෙයි.

මීට අමතරව කැස්පියන් සාගරයේ තැංගුරම් ලා ඇති සිය යුද නෞකා මගින් තිකුත් කෙරුණු කැලිබර් කෘස් මිසයිල මගින් යුක්රේනයේ කොස්ට්ආන්ටිවකා පළාතේ පිහිටි තවත් බොරතෙල් ගබඩා පරිශ්‍රයක් ඉලක්ක කරගෙන ඇත. එසේම උතුරුදිග යුක්රේනයේ පිහිටි ආයුධ අලුත්වැඩියා කිරීමේ කර්මාන්තශාලාවක්ද මෙම කෘස් මිසයිලවල ඉලක්කය වී තිබේ.

මේ අතර රුසියාවේ යුක්රේන ආක්‍රමණය සම්බන්ධයෙන් රුසියානු බලධාරීන් සමග තේරුමක් ඇති සාකච්ඡාවක් සිදු කිරීමට තම රජය සූදානම් බව යුක්රේන ජනාධිපති වොලොඩිමීර් සෙලෙන්ස්කි පවසයි. පසුගියදා එරට ජනාධිපති මෙන්දිරය ඉදිරිපිට වීඩියෝ පණිවුඩයක් තිකුත් කරමින් ජනපතිවරයා මේ බව පවසා තිබේ.

මේ දක්වා රුසියානු - යුක්රේන සාකච්ඡා එට කිහිපයක් පැවැත්වී ඇති අතර, ඉන් වට හතරක් මුහුණාව මුහුණත්, වට කිහිපයක් අන්තර්ජාල වීඩියෝ සාකච්ඡා හරහාත් සිදු විය. කෙසේ වෙතත් මේ දක්වා එම කිසිදු සාකච්ඡාවකින් ගැටුම් නිමා කිරීමේ එකඟතාවකට පැමිණීමට දෙපාර්ශවයට නොහැකි වී තිබේ.

යුක්රේනයේ විපක්ෂ දේශපාලන පක්ෂ රුසක් තහනම් කෙරේ

- ජනපතිගේ අනින් යුක්රේනයේ ජාතික රූපවාහිනි නාලිකා සියල්ල ඒකාබද්ධ කෙරේ

යුක්රේනය තුළ ක්‍රියාත්මක විපක්ෂ දේශපාලන පක්ෂ රුසක් තහනම් කිරීමට එරට රජය තීරණය කර ඇතැයි වාර්තා වෙයි. ඒ අනුව එරට පාර්ලිමේන්තුවේ දෙවැනි විශාලතම පක්ෂය වන For Life පක්ෂයද මෙම ලැයිස්තුවට ඇතුළත් වන බව පැවසෙයි. යුක්රේන - රුසියානු අර්බුදය හමුවේ මෙම පක්ෂ වීවීධ මත දරන බවත්, ඔවුන් සතුව යම් රුසියානු හිතවාදී සබඳතා පවතින බවටත්, පෝදැනා කරමින් මෙම තහනම පැනවී තිබේ.

යුක්රේන ජනාධිපති වොලොඩිමීර් සෙලෙන්ස්කි විසින් පැයේ (20ලා) දිනයේදී එරට ජාතික සුරක්ෂිතතාව සහ ආරක්ෂාව පිළිබඳ කවුන්සිලය වෙත මේ පිළිබඳ තීරණය දැනුම් දී තිබේ. "දැනට රට තුළ ක්‍රියාත්මකව පවතින හමුවා නීතිය යටතේ මේ විපක්ෂ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරකම් අත්හිටුවීමට අපට සිදුවෙනවා. මොකද මගා පරම්පරා ගැටුමය ගැටුමක් පවතින අවස්ථාවේදී ඇතැම් දේශපාලන කණ්ඩායම් පැසිසයාවට පක්ෂපාතිව කටයුතු කරනවා." ජනපතිවරයා පවසා ඇත.

මේ අතර යුක්රේනයේ ක්‍රියාත්මක රාජ්‍ය රූපවාහිනි නාලිකා සියල්ලම ඒකාබද්ධ කරමින් එක් තනි මාධ්‍ය වේදිකාවක් පිහිටුවන බව යුක්රේන ජනාධිපති වොලොඩිමීර් සෙලෙන්ස්කි පවසයි. පසුගියදා ඔහු ඔහුගේ වීඩියෝ පණිවුඩයක් මගින් මේ බව පවසා තිබේ.

ඇමෙරිකානු සමාගමක් නිපදවූ රයිෆල් 400ක් යුක්රේනයට ප්‍රදානය කෙරේ

ඇමෙරිකා එක්සත් ජනපද ගිනිඅවි නිෂ්පාදන සමාගමක් වන The Keltec සමාගම මගින් නිපදවූ එක්සත් ජනපද ඩොලර් ලක්ෂ 2ක් පමණ වටිනාකමින් යුත් රයිෆල් 400ක තොගයක් යුක්රේන හමුදාව වෙත ප්‍රදානය කිරීමට එම සමාගම තීරණය කර ඇතැයි පවසයි.

එක්සත් ජනපදයේ ෆ්ලොරිඩා ප්‍රාන්තයේ මෙම අව නිෂ්පාදන සමාගම පිහිටා ඇත. යුක්රේනයේ මෙබඳු පළාතේ පිහිටි ගැලුම්කරුවෙකු විසින් ලබා දුන් ඇණවුමක් අනුව එම ගිනිඅවි නිපදවා ඇති බවත්, සුදු ගැටුම් භාරම්භවීමේ සමගින්ම එහි ඇණවුම්කරු එවා මිලදී ගැනීමට නොපැමිණීම සහ ඔහු සම්බන්ධ කරගැනීම නොහැකි වීම නිසා එම තොගය මෙලෙස අත්හැර දමා තිබෙන බවත් සමාගම පවසයි.

මෙහිදී එම රයිෆල් 400ක තොගය විදේශීය නියෝජිත ආයතනයක් හරහා යුක්රේනය වෙත රැගෙන යාමට අදාළව සමාගම එක්සත් ජනපද අධිකරණ දෙපාර්තමේන්තුවට දැනගමින් දැනුම් දී ඇත. ඒ අනුව පළමු වටයේදී එම ගිනිඅවි නේදෝර් සාමාජික රටක් වෙත ළඟාවීමෙන්, අනතුරුව ඒවා යුක්රේනය වෙත ප්‍රවාහනය කිරීමෙන් සැලසුම් වී ඇත.

ISS හි සිටින සිය අප්‍රටාකාශගාමීන් යුක්රේනයට සහාය දැක්වීමේ අදහස රුසියාව ප්‍රතික්ෂේප කරයි

"හැම තැනකදීම යුක්රේන කොඩිය දැකීමත් එක විදියක පිස්සුවක්" - රුසියාවේ රොස්කොස්මොස් ආයතනය පවසයි

පාවිච් කක්ෂයේ පිහිටි ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයෙහි (ISS) රැඳී සිටින රුසියානු අප්‍රටාකාශගාමීන් පසුගියදා සම්පූර්ණයෙන්ම කඳ පසෙකින් අභ්‍යවකාශය ඇදුම් අඳ අන්තේ යුක්රේනයට සහාය පළ කිරීමකට යන මාධ්‍ය වාර්තා ප්‍රතික්ෂේප කරන බව රුසියානු අභ්‍යවකාශ ආයතනය වන රොස්කොස්මොස් පවසයි.

"සමරෙ වීට කඳ පාට කියන්නේ කඳ පාට වීතරයි. අපේ කව අප්‍රටාකාශගාමී කණ්ඩායම වෙත මේ අඳුනින් සැසසපු අභ්‍යවකාශ ඇඳුම් නිර්මාණය කළේ බලුමාන් මොස්කව් රාජ්‍ය තාක්ෂණික විශ්වවිද්‍යාලය මගිනි. ඉන් උපායිය හැදෑරූ අප්‍රටාකාශගාමීන් තිබෙනන්නේ මේ කණ්ඩායමේ ඉන්නවා. මේ විදියට දැකිග දැකිග හැම තැනම යුක්රේන කොඩිය දැකීමත් එක විදියක පිස්සුවක්" යනුවෙන් එම ආයතනය සඳහන් කර තිබේ.

මේ අතර පසුගිය සිකුරාදා දිනයේදී ISSහි සිට සජිවී මාධ්‍ය හමුවක් වෙත සහභාගි වූ එහි සිටින මෙහෙයුම් ප්‍රධානියා සහ රුසියාවේ ජෝෂ්ඨතම අප්‍රටාකාශගාමියෙකු වන මෑලේ ආර්ටෙමියෙව්, "මේ සෑම කණ්ඩායමකටම එකතැක එකක් වෙනස් වර්ණ තෝරාගැනීමේ අවස්ථාව තිබුණා. මෙය අලුත් වර්ණයක් තෝරාගැනීමේ අවස්ථාවයි. ඒ නිසා අපි මෙතෙක්දුම කළ පාට යොදා ගෙන තිබුණා." යනුවෙන් පවසා තිබේ.

ක්‍රිමියාව රුසියාවට ඈදා ගැනීමේ අටවැනි සංවත්සරය පුටින්ගේ ප්‍රධානත්වයෙන්

යුක්රේනයට අයත්ව තිබූ ක්‍රිමියාව අර්ධද්වීපය රුසියානු පාලනය වෙත නතු කරගැනීමේ අට වැනි සංවත්සරය පසුගියදා යෙදී තිබුණි. එය සැමරීම වෙනුවෙන් රුසියානු ජනාධිපති ව්ලැදිමීර් පුටින්ගේ ප්‍රධානත්වයෙන් දුරවිදන්ත උත්සවයක් ක්‍රිමියානු අර්ධද්වීපයේ ක්‍රීඩාංගණයකදී සංවිධානය විය. මෙම අවස්ථාව සඳහා රුසියානු හිතවාදීන් සහ පුටින් අනුගාමිකයන් දහස් ගණනක් සහභාගි වී තිබේ. එමිදී පුටින් යුක්රේනයට එල්ල කරන ප්‍රහාර රුසියානු හමුදාවන්ගේ විශේෂිත හමුදාමය මෙහෙයුමක් ලෙස යළිත් වරක් හඳුන්වාදී තිබුණි.

අලුත උපන් කළු රයිනෝ පැටවෙකු යුක්රේනයේ කිව් අගනුවර නමින් නම් කරයි

වෙක් ජාතරයේ සත්වෝද්‍යානයකදී අලුත උපන් කළු රයිනෝ පැටවකු යුක්රේනයේ කිව් අගනුවර මමින් නම් කිරීමට එම සත්වෝද්‍යානයේ බලධාරීන් පියවර ගෙන ඇතැයි වාර්තා වෙයි. රුසියානුවේ යුක්රේන ආක්‍රමණය හමුවේ තවදුරටත් නොසැඟී සිටින කිව් අගනුවරට සහාය දැක්වීමේ ලෙස මෙම නම් කිරීම සිදුකළ බව වෙක් ජාතරය සඳහන් කරයි.

පසුගිය මාර්තු 04වැනිදා වෙක් ජාතරයේ Duvur Kralove සත්වෝද්‍යානයේදී මෙම රයිනෝ උපත සිදුවා තිබේ. අද වනවිට මෙම උපවර්ගයට අයත් කළු රයිනෝ සඳහන් වැඩිම ප්‍රමාණයක් වාසය කරන පරිශ්‍රය ලෙසද මෙම සත්වෝද්‍යානය සැලකෙයි. "මෙලෙස රයිනෝ සත්වත්වය කිව් නමින් නම් කිරීම යුක්රේනයේ වීරවරයන් අප උක්රේන සතෝෂය තරවදුරටත් පෙන්නුම් කිරීමෙන්." යනුවෙන් සත්වෝද්‍යානයේ අධ්‍යක්ෂවරයා සඳහන් කර ඇත.

අලුත උපන් මෙම රයිනෝ සත්ත්වයා මේ වනවිට මවගේ රැකවරණය යටතේ පසුවන බවත්, සෑම දිනකදීම උදේ බර කිලෝග්‍රෑම් එකකින් වර්ධනය වන බවත් සත්වෝද්‍යාන බලදාරීන් සඳහන් කරයි.

රුසියානු ප්‍රහාර හමුවේ යුක්රේන සිවිල් වැසියන් 840ක් මිය ගිහින්

එක්සත් ජාතීන්ගේ සංවිධානය පවසයි

රුසියානු හමුදාවන් යුක්රේන ආක්‍රමණය ආරම්භ කෙරුණු පසුගිය පෙබරවාරි 24වැනිදා සිට ගත වූ දින 25ක කාලය තුළදී එරට තුළ සිවිල් රුසියන් 847දෙනෙකු මරණයට පත්ව ඇතැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය පවසයි. ඒ අතර දරුවන් 64දෙනෙකුද වන බව පැවසයි.

මේ අතර යුදු ගැටුම් හේතුවෙන් මේ දක්වා සිවිල් වැසියන් 1,399දෙනෙකු තුවාල ලබා ඇති අතර, ඉන් 78දෙනෙකුම දරුවන් වන බවත් පවසයි. මෙහිදී රුසියානු ලෝල් වෙඩි ප්‍රහාර සහ ගුවන් ප්‍රහාරවලින් සිදුවන පිවිත හානිය ඉහළ බවද එම සංවිධානය පෙන්වා දෙයි.

❖ GRAMMAR
❖ SPOKEN
❖ LITERATURE
❖ APPRECIATION
❖ COMPREHENSION
❖ CREATIVE WRITING

zoom WhatsApp

Diploma in English
Batch No 118 Admission Now
Duration : 6 Month, Day : Sunday
Time : 8.30am - 2.30pm
Evening Class Taime : 7pm - 8.30pm
Days : Friday, Saturday, Sunday

දැනස් පෙළ හා සාමාන්‍ය පෙළ ළිය අවසන් කළ සිසුන්ට, විශේෂ විදුලාල සිසුන්ට හා සාක්ෂිවේදනය ආයතනයන්ගේ සම්බන්ධ අයට සහ ඉතිකර අවස්ථාවන් හි සිටුනු අයට, බැසයා යෝධසයන්ට හා සංවාරක සේවාවන් හි නිදුනු අයට, උපාධිධාරී පත්වීම් ලාභීන්ට, විමල්ගගනවීමට බිලාපපාවරන්නු වන අයට, අදාළ වන පරිදි සකස්කොට ඇති මෙම ඩිප්ලෝමා පාඨමාලාව රාජ්‍ය සංස්ථාවල හා වෙඩ ආයතනයන්හි උසස් තිළධාරීන් සඳහා ද පවත්වන්නේ.

Certificate in Professional English Course
Batch No 118 Admission Now
Duration : 6 Month Day : Sunday
Time : 8.30 - 2.30
Evening Class Taime : 7.00pm - 8.30pm
Days : Friday, Saturday, Sunday

ඉංග්‍රීසි දැනුම අදුබණිත් රැකියාවක් අහිමිවූ, රැකියාවේ උසස්වීම් අහිමි වූ අය සඳහා ඉංග්‍රීසි භාෂාව මුල් සිට ඉතා සරලව පාසලක්තර ඔට්ටෙමේ සිළුගත් ක්‍රමවේදයක්ව අනුව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිතව මෙම පාඨමාලාව සකසා ඇත. තරුණ, වැඩිහිටි, පාසැදැ සිසුන් හා වෘත්තිකවේදීන් යන ගීනම අයෙකුට සුදුසු වන අයුරින් මෙම පාඨමාලාවේ විෂය නිර්දේශයන් සකසා ඇත.
පළපුරුදු මිතුශිලී තරුණ ඉංග්‍රීසි උපාධිධාරීන් විසින් දේශන පවත්වනු ලබයි.

Beginnes' in English
Batch No 118 Admission Now
Duration : 3 Month Day : Sunday
Time : 8.30 - 2.30
Evening Class Taime : 7.00pm - 8.30pm
Days : Monday, Tuesday, Wednesday

යන්තම්පවත් කථා කරන්න බැරි ද?
සරල වාක්‍යන්වත් ලියාගන්න අමාරු ද?
මූලික දැනුම් නැති නිසා පන්තියකට යන්න බය ද?

එහෙමනම් ඔබට ගැලපෙනම ඉංග්‍රීසි පන්තිය සඳහා දැන්ම අපදුම් කරන්න. ඩිපයිපරෙන් පිටපත සරලව මුල සිට ක්‍රමවත්ව පුහුණුව. මුලින් නොදැන්න සෙයෙක් වුවද වටහන ගෙන පුහුණු කරනු ලබයි. දැනුම අපු අයට විශේෂ පුහුණු ක්‍රම. සුදුසුකම් ලත් තරුණ සුහදශීලී ඉංග්‍රීසි උපාධිධාරීන් විසින් දේශන පවත්වනු ලබයි.

Jinarathana English Academy, No 142, Sir James Peiris Mawatha, Colombo 02.
Call Now : 071 975 18 18 , 076 803 33 20, 011 238 66 38
WhatsApp Number : 071 255 18 18

JINARATHANA ENGLISH ACADEMY
Online English course
Zoom App and WhatsApp

මිල ඉහළයාම ගැන මැඩිරිඩි අගනුවර විරෝධතා

ස්පාඤ්ඤයේ ආහාර, විදුලිය සහ ඉන්ධන මිල ඉහළ යාමට එරෙහිව පසුගිය සෙනසුරාදා දිනයේදී එරට මැඩ්රිඩ් අගනුවරදී විරෝධතා සංවිධානය වූ බව විදෙස් මාධ්‍ය පවසයි. එරට අන්තර දැක්විණාංශය Vox පක්ෂයේ මූලිකත්වයෙන් මෙම විරෝධතා පැවැත්ව තිබේ. විශේෂයෙන්ම අද වනවිට ඉහළ ගොස් ඇති පිවන වියදම සමපුවේ ස්පාඤ්ඤ පවුල්වලට සිය මාසික බිල්පත් ගෙවීම ගැටලුවක් බවට පත්ව තිබෙන බව පක්ෂය වෝදනා කරයි. මෙහිදී මැඩ්රිඩ් අගනුවර හතර ගාලක ඉදිපිහිටිදී දහස් ගණනක පිරිසක් රැස්ව තිබේ. ඔවුන් ස්පාඤ්ඤ ජාතික ධජ සහ රාජ්‍ය විරෝධී පාධ ඇතැළත් පුවරු පුදර්ශනය කර ඇත. ස්පාඤ්ඤයේ සමාජවාදී පක්ෂයේ අගමැති පෙඩ්‍රෝ සැන්චෙස් ධුරයෙන් ඉවත්ව යා යුතු බව ඔවුන්ගේ මූලික ඉල්පෙන්ම වී තිබේ.

උතුරු කොරියාව කහ මුහුදට රොකට්ටු හතරක් කරයි

උතුරු කොරියාව සිය රොකට් අත්හදා බැලීමක් යටතේ ඊයේ (20ලා) පෙරවරුවේදී රොකට් පුහාර හතරක් එල්ල කර ඇතැයි දකුණු කොරියානු බලධාරීන් පවසයි. පසුගිය කාලයක් අතරතුරදී මෙම රොකට් ප්‍රහාර හතර එල්ල වී තිබේ. විශේෂයෙන් සඳහන් කොකෙරුණු ස්ථානයක සිට මෙම රොකට්ටු කිහුත් කෙර